2022

වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම්

வருடாந்த செயலாற்றுகை அறிக்கையும் கணக்குகளும்

Annual Performance Report & Accounts

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පුත්තලම -

மாவட்ட செயலகம் - புத்தளம்

District Secretariat - Puttalam

273

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிர்வாக,உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government

පටුන

පරිච්ඡේදය	මාතෘකාව	පිටු අංක
01	**ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	
	1.1 හැඳින්වීම	3-4
	1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර,අරමුණු	5
	1.3 ප්‍රධාන කාර්යයන්	6
	1.4 සංවිධාන සටහන	7
	1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල	8
	1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධ කාර්යාල	9
	1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)	10
02	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	11
03	**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	
	3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	12
	3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	13
	3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	14
	3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්	15-19
	3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	20
	3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	20
	3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පලාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	21-23
	3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	24
	3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව	25(1-16)
04	**කාර්ය සාධන දර්ශක**	
	4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	26
05	**තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	
	5.1. හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු දක්වන්න	27-30
	5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	30
06	**මානව සම්පත් පැතිකඩ**	
	6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	31
	6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න	31
	6.3 මානව සම්පත් සංවර්ධනය	32
0 7	**අනුකූලතා වාර්තාව**	33-38

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ලාංකික වංශ කතාවේ නිජ භූමිය වූ පුත්තලම දිස්ත්‍රික්කය ජල පෝෂිත ප්‍රදේශද සමඟ වර්ග කිලෝ මීටර් 3072 ක භූමි ප්‍රමාණයකින් සමන්විතය. උතුරින් කලා ඔයෙන්ද, නැගෙනහිරින් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ද, දකුණෙන් මා ඔයෙන්ද, බටහිරින් ඉන්දියන් සාගර වෙරළ තීරයෙන් සීමාවී ඇති පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය දිගින් කිලෝ මීටර් 120 වන අතර පළලින් කිලෝ මීටර් 50 පමණ වේ.

උතුරෙන් හා දකුණෙන් ගංගා ද්‍රෝණි දෙකකින් මායිම් වූ මෙම දිස්ත්‍රික්කය පෝෂණය කරමින් මී ඔය, දැදුරු ඔය, බත්තුළු ඔය සහ සෙංගල් ඔය දිස්ත්‍රික්කය මැදින් ගලා බසින්නේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ විවිධ වූ අවශ්‍යතාවයන් සපුරාලමිනි. එමෙන්ම අතීතයේ සිට පැවත එන දියුණු වාරිමාර්ග පද්ධතිය තුලින් පෝෂණය වන වී ගොවිතැන දිස්ත්‍රික්කයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වී ඇත. මී ඔය හරස්කොට ඉදිකොට ඇති ඉහිණිමිටිය ජලාශය, තබ්බෝව ජලාශය සහ මෑතකදී ඉදි වූ සෙංගල් ඔය ජලාශය ප්‍රමුඛ කොටගත් වැව් අමුණු වලින් ගොවිතැනට අවශ්‍ය ජලය සපයා දෙයි. කොට්ටුකච්චිය ගොවි ජනපදය, කරවිට ගොවි ජනපදය හා නීල බැම්ම ගොවි ජනපදය දිස්ත්‍රික්කයේ වී අස්වැන්නෙන් බහුතර ප්‍රමාණයකට දායකත්වය සලසයි.

කල්පිටිය ප්‍රදේශයේ ජනතාව භූගත ජලය උපයෝගී කරගෙන රතුලුණු, මිරිස්, ගෝවා, බීට්රූට්, කැරට්, ගර්කින්, පැණිකොමඩු, දුම්කොල වැනි වගාවන් ඉතා සාර්ථකව කරමින් ආදායම් මාර්ග සපුරා ගනියි. ආරච්චිකට්ටුව, ආණමඩුව ප්‍රදේශ වල පවතින කඳු වගාව මෙන්ම පුත්තලම කල්පිටිය, වනාතවිල්ලුව, කරුවලගස්වැව යන ප්‍රදේශ වල මහා පරිමාණයෙන් පවත්වාගෙන යන ගස්ලබු, ඩ්‍රැගන්ෆෘට්, කිලෝපේර, දොඩම් යන වගාවන් තුලින් දේශීය පලතුරු අවශ්‍යතාවය සපුරාලන අතරම, අපනයනය තුලින් විදේශ විනිමය ඉපයීමටද හැකි වී ඇත.

කිලෝ මිටර් 150 ක දිගින් යුතු මුහුදු තීරයකින් සමන්විත මෙම දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය කරදිය මත්ස්‍ය කර්මාන්තය වන අතර වෙරළ තීරයත් සමඟ පවතින කලපු ජලාශ වල සිදුකරන ඉස්සන් වගාව තුලින් විදේශ විනිමය උත්පාදනයටද දායක වෙයි. එමෙන්ම දිස්ත්‍රික්කය පුරා පිහිටි ඔයවල් හා වැව් අමුණු ආශ්‍රිතව සිදුකරන මිරිදිය මත්ස්‍ය කර්මාන්තය තුලින් මත්ස්‍ය අවශ්‍යතාව සපුරාලමින් දේශීය ආර්ථිකයට විශාල මෙහෙවරක් ඉටු කරයි.

විල්පත්තු අභයභූමිය වර්ග කිලෝමීටර් 1317ක් පුරා පැතිර පවතිමින් දිස්ත්‍රික්කයේ ජෛව විවිධත්වය පවත්වාගන්නා අතරම රැම්සා තෙත් බිමක් වන ආනවිලුන්දාව අභයභූමිය ලොව ප්‍රකටය. එමෙන්ම සංචාරක කුරුල්ලන් රාශියක අවසන් ගමනාන්තය වන්නේද පුත්තලම දිස්ත්‍රික්කයයි.

කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපලට ආසන්නව පිහිටා තිබීමත්, විදේශීය බැතිමතුන්ගේ ගෞරවාදරයට හා භක්තියට ලක්වන මුන්නේෂ්වරම් කෝවිල, තලවිල ශාන්ත ආනා දෙවි මැදුර වැනි ආගමික සිද්ධස්ථාන පිහිටීමත් නිසා විදේශ සංචාරකයන්ගේ විශේෂ ආකර්ෂනය දිනූ දිස්ත්‍රික්කයක් ලෙස පුත්තලම දිස්ත්‍රික්කය හඳුනාගත හැක.

කල්පිටිය මුහුදු තීරයේදී ඩොල්ෆින් මසුන් නැරඹීමට ඇති අවස්ථාව මෙන්ම බත්තලන්ගුණ්ඩු වැනි දූපත් වලටසංචාරය කිරීමට ඇති අවස්ථාව නිසා විදේශිකයන්ගේ මෙන්ම දේශීය සංචාරකයන්ගේද ආකර්ෂනය මෙම දිස්ත්‍රික්කයට යොමුව ඇත. දෙස් විදෙස් සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක

හෝටල් 116ක් පවත්වාගෙන යන අතර සංචාරක කර්මාන්තය ආශ්‍රයෙන් සෘජු හා වක්‍ර ආදායම් මාර්ග තුලින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වීමට පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනතාවට හැකිවී ඇත.

පුත්තලම දිස්ත්‍රික්කය විවිධ වූ ඛනිජ සම්පත් වලින් සමන්විත දිස්ත්‍රික්කයක් බැවින් ඒ ආශ්‍රිත කර්මාන්ත බිහිවී ඇත. වනාතවිල්ලුව අරුවක්කාඩු ප්‍රදේශයේ ස්වභාවික හුණුගල් නිධියක් පිහිටීම නිසා පුත්තලම ප්‍රදේශයේ සිමෙන්ති කම්හලක් ඉදිකොට ඇත.ශ්‍රී ලංකාවේ වීදුරු සහ පිඟන් නිෂ්පාදනයට අවශ්‍ය සිලිකා වැලි ඇත්තේ නාත්තණ්ඩිය සහ මාදම්පේ ප්‍රදේශයේය. සිලිකා වැලි ආශ්‍රිතව කර්මාන්ත රාශියක් එම ප්‍රදේශ වලදී හඳුනාගත හැක. දංකොටුව හා වෙන්නප්පුව ප්‍රදේශවල උළු මැටි ආශ්‍රිත කර්මාන්ත දක්නට ලැබෙන්නේ එම කර්මාන්තයට අවශ්‍ය මැටි එම ප්‍රදේශයේ පවතින බැවිනි.

විවිධ වූ ස්වභාවික සම්පත් රාශියකින් අනූන වූද කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය තුලින් වගේම විදේශගත රැකියා තුලින්ද ආර්ථිකය සවිමත් කරගන්නා බහු වාර්ගික බහු ආගමික ජනතතාවක් සහජීවනයෙන් යුතුව ජීවත්වන දිස්ත්‍රික්කයක් ලෙස පුත්තලම දිස්ත්‍රික්කය හඳුනාගත හැකිය.

එමෙන්ම ජාතික බලශක්ති සැලැස්ම වෙනුවෙන් විශාල දායකත්වය සපයන නොරොච්චෝල තාප බලාගාරය සහ සුළං බලශක්ති බලාගාර මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම විශේෂත්වයකි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය පමණක් නොව දිස්ත්‍රික්කයේ සමාජ, ආර්ථික කළමනාකරණයේ කේන්ද්‍රස්ථානය ද විය යුතු බව පිළිගනිමින් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සිය කටයුතු ආරම්භ කර දිස්ත්‍රික්කයේ ආර්ථික සංවර්ධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ අභියෝග ජය ගැනීම සඳහා අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන පමණක් නොව රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය ද එක්ව දිස්ත්‍රික්කයේ පවතින භෞතික හා මානව සම්පත් උපරිම ප්‍රයෝජනය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර , අරමුණු

දැක්ම

භෞතික හා මානව සම්පත් ඵලදායිව හා කාර්යක්ෂමව මෙහෙයවමින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට යහපත් ජීවන තත්වයක් ලඟා කර දීම

මෙහෙවර

දිස්ත්‍රික්කය තුල තිරසාර සංවර්ධන ක්‍රියාවලියක් තහවුරු කරනු වස්,ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව,යුක්ති ගරුකව සහ මිත්‍රශීලීව ඉටු කිරීම සඳහා භෞතික සම්පත් හා මානව සම්පත් ඵලදායි ලෙස මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම

අරමුණු

I. කාර්යක්ෂම, සාධාරණ, යුක්ති සහගත සහ සුහද සේවා සැපයීමකින් යුතු යහපත් පාලනයක් තුළින් පුරවැසියන් සවිබල ගැන්වීම

II. ප්‍රශස්ත පාරිභෝගික තෘප්තියක් ලබා ගැනීමේ අරමුණින් ජනතාවට හිතකාමී සහ මහජන මිත්‍රශීලි රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා සියලු උත්සාහයන් ගැනීම.

III. අනෙකුත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ජනතාවගේ පාරිසරික, ආර්ථික, සමාජ හා සංස්කෘතික අවශ්‍යතා සපුරාලීම

IV. නීතිය හා සාමය බලාත්මක කිරීම තුළින් දිස්ත්‍රික්කයේ සාමය හා ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා අදාළ බලධාරීන්ට සහාය වීම

V. අනෙකුත් රාජ්‍ය ආයතන ,රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයද දිස්ත්‍රික්කයේ ආර්ථික සංවර්ධන හා සමාජ සංවර්ධන අභියෝග ජයගැනීම සඳහා සම්බන්ධීකරණ කර ගැනීම

1.3 ප්‍රධාන කාර්යයන්

I දිස්ත්‍රික් පරිපාලනය සඳහා අවශ්‍ය සියලුම ව්‍යවස්ථාපිත රාජකාරි

II දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම

III ආපදා, සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල පරිපාලන කටයුතු

IV දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය කිරීම

V මැතිවරණ කටයුතු සම්බන්ධීකරණය

VI දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති පරිපාලනය හා ක්‍රියාත්මක කිරීම

VII රේඛීය අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම

VIII විවිධ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ පිළිගත් සංවර්ධන ප්‍රතිපත්ති අනුව මග පෙන්වීම

IX ආර්ථික සංවර්ධන හා සමාජ සංවර්ධන අභියෝග ජයගැනීමට කටයුතු කිරීම

X පළාත් සභාවේ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම

1.4 සංවිධාන සටහන


දිස්ත්‍රික් ලේකම්
සැලසුම් අධ්‍යක්ෂ
ප්‍රධාන ගණකාධිකාරී
අතිරේක දිස්ත්‍රික් ලේකම්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර කොමසාරිස් - දිවිනැගුම
සහකාර කොමසාරිස් - මැතිවරණ
සහකාර කොමසාරිස් - ආපදා
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
සහකාර පාලක - පුපුරණ ද්‍රව්‍ය
සංඛ්‍යාලේඛනඥ
සහකාර අධ්‍යක්ෂ- කෘෂිකර්ම
සහකාර අධ්‍යක්ෂ- ඉඩම් පරිහරණ හා සැලසුම්
මෝටර් රථ පරීක්ෂක
සහකාර අධ්‍යක්ෂ- ක්‍රීඩා ව්‍යාපාර
භාරකරු - මිළ පාලන ඒකකය
භාරකරු - පාරිභෝගික කටයුතු
දිස්ත්‍රික් සම්බන්ධීකාරක- සමාජ ආරක්ෂණ
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරී
දිස්ත්‍රික් ඉංජිනේරු
සහකාර දිස්ත්‍රික් ලේකම්
භාෂා පරිවර්තක
පරිපාලන නිලධාරී
කාර්ය මණ්ඩල
මුදල් සහකාර
ප්‍රධාන කළමනාකරණ සහකාර
ප්‍රධාන කළමනාකරණ සහකාර
අයවැය සහකාර/සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන/ක්ෂේත්‍ර නිලධාරී
සංවර්ධන නිලධාරී
තාක්ෂණ නිලධාරී/සැලසුම් ශිල්පී
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කනිෂ්ඨ සේවකයෝ
කනිෂ්ඨ සේවකයෝ
කනිෂ්ඨ සේවකයෝ
කනිෂ්ඨ සේවකයෝ

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1. වනාතවිල්ලව
2. කරුවලගස්වැව
3. පුත්තලම
4. කල්පිටිය
5. නවගත්තේගම
6. ආණමඩුව
7. මකුඹුක්කඩවල
8. මුන්දලම
9. පල්ලම
10. ආරච්චිකට්ටුව
11. හලාවත
12. මාදම්පේ
13. මහවැව
14. නාත්තාන්ඩිය
15. වෙන්නප්පුව
16. දංකොටුව



1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අනුබද්ධ කාර්යාල

1 දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය

2 දිස්ත්‍රික් සැලසුම් අංශය

3 සංගණන හා සංඛ්‍යා ලේඛන අංශය

4 මැතිවරණ කාර්යාලය

5 ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය

6 කුඩා ව්‍යාපාර අංශය

7 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

8 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

9 දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය

10 මෝටර් රථ අංශය

11 සංස්කෘතික අංශය

12 බෞද්ධ /හින්දු/මුස්ලිම් කටයුතු අංශය

13 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අංශය

14 විදේශ රැකියා අංශය

15 සමාජ සේවා අංශය

16 ඵලදායිතා අංශය

17 රැකිරක්ෂා හා මානව සම්පත් අංශය

18 ළමා හා කාන්තා කටයුතු අංශය

19 සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සම්බන්ධීකරණ ඒකකය

20 පළාත් ඉඩම් කාර්යාලය

21 මාධ්‍ය ඒකකය

22 ආපදා සහන සේවා අංශය

23 මිල පාලන අංශය

24 ප්‍රමිති හා මිණුම් ඒකකය

25 පාරිභෝගික අංශය

26. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය අංශය

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ) ව්‍යාපෘතියේ නම - නැත

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි.

ඈ) ව්‍යාපෘති කාල සීමා

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ , අභියෝග හා ඉදිරි ඉලක්ක

අභියෝග

1. අලි මිනිස් ගැටුම
2. වියළි කාලගුණික තත්වය සහ මෝසම වර්ෂාවන් නිසා ඇතිවන ආපදා තත්ත්වය
3. දිස්ත්‍රික්කය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාවය
4. ගෝලීය වසංගත තත්ත්වය සහ මිනිසුන්ගේ ජීවන රටාව සහ සමාජ හා ආර්ථික පරිවර්තනය කෙරෙහි එහි බලපෑම ජය ගැනීම.
5. දිස්ත්‍රික්කයේ පවත්නා සම්පත් ඌණ උපයෝජනය

ඉදිරි ඉලක්ක

1. දිළිඳුකම සහ විරැකියා අනුපාතය අඩු කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
2. දිස්ත්‍රික්කය තුළ ඇති සම්පත් හැකිතාක් උපයෝගි කරගනිමින් පෝෂණ මට්ටම ඉහළ නංවමින් සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහිකිරීම.
3. මත්ද්‍රව්‍ය භාවිතය හැකිතාන් අවම මට්ටමක පත්කරමින් ග්‍රාමීය දරිද්‍රතාවය දුරු කරමින් විනය ගරුක සමාජයක් බිහිකිරීම
4. පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් අවම මට්ටමක පවතින ජනතාව හැකිතාන් අවම කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
5. පුනර්ජනනීය බලශක්ති භාවිතය දිරිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
6. කාන්තාවන් සවිබල ගැන්වීම තුළින් සමාජ ආර්ථික පුනර්ජීවනයක් ඇතිකිරීම
7. ඌන උපයෝජනය වී ඇති ඉඩම් තිරසාර සංවර්ධනය ලඟා කර ගැනීම සඳහා මනා ලෙස කළමනාකරණය.
8. ව්‍යවසායකත්ව පුහුණුව සහ ණය පහසුකම් හා නව ව්‍යවසායකයින් බිහි කිරීම තුළින් දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය ඉහළ නැංවීම .
9. නව්‍යකරණයන් හඳුන්වාදීම තුළින් සමාජ ආර්ථික පුනර් නිර්මාණය තුළින් කෘෂිකර්මාන්තයේ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ඉහළ නැංවීම
10. අධ්‍යාපන, රැකියා,ඉදිකිරීම් තාක්ෂණික ඇතුළු සියළුම ක්ෂේත්‍රවල මාර්ගගත පද්ධතිය භාවිතය ශක්තිමත් කිරීම.

එච්.එම්.එස්.පී. හේරත්,
දිස්ත්‍රික් ලේකම් /දිසාපති,
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය

එච්.එම්.එස්.පී.හේරත්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය

කාර්යසාධන වාර්තාව 2022 Page 11

3.පරිච්ඡේදය-2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

					ඒඕඒ-එෆ්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය					
අයවැය 2022 රු.		සටහන්	තක්ෂ 2022 රු.	2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒඕඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,814,365,000	4,111,132,000	ඒඕඒ-3
-	තැන්පතු		169,406,578	482,159,759	ඒඕඒ-4
-	අත්තිකාරම් ගිණුම්		68,109,003	86,017,999	ඒඕඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,051,880,581**	**4,679,309,758**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,051,880,581**	**4,679,309,758**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		55,223,500	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**2,996,657,081**	**4,679,309,758**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
754,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	727,243,204	682,528,742	
150,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	140,726,696	316,856,170	ඒඕඒ-2(ii)
10,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	7,661,055	304,906,761	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
915,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**875,630,955**	**1,304,291,673**	
	මූලධන වියදම්				
15,700,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	14,417,540	13,346,102	
26,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	25,794,132	112,272,527	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒඕඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	**13**	-	-	
1,300,000	හැකියා වර්ධනය	**14**	495,370	398,175	
356,000,000	වෙනත් මූලධන වියදම්	**15**	298,055,517	4,184,946	
399,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**338,762,559**	**130,201,749**	
	තැන්පතු ගෙවීම්		246,645,457	454,469,557	ඒඕඒ-4
	අත්තිකාරම් ගෙවීම්		58,218,921	80,713,743	ඒඕඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**304,864,378**	**535,183,300**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,519,257,891	1,969,676,722	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**1,477,399,190**	**2,709,633,036**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		1,477,399,190	2,709,633,036	ඒඕඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒඕඒ-3
1,314,000,000			**1,477,399,190**	**2,709,633,036**	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,773,482,729	2,731,475,762
මූල්‍ය වත්කම්		-	
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	178,532,192	188,422,275
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**2,952,014,921**	**2,919,898,037**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,499,596	(57,849,201)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,773,482,729	2,731,475,762
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	169,032,596	246,271,475
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		-
මුළු වගකීම්		**2,952,014,921**	**2,919,898,037**

පිටු අංක 7 සිට 29 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 30 සිට 38 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : නීල් බණ්ඩාර හපුහින්න
තනතුර : ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දිනය : 2023.02.20

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

.....
ගණන්දීමේ නිලධාරී
නම : එච්.එම්.එස්.පී.හේරත්
තනතුර : දිස්ත්‍රික් ලේකම්
දිනය : 2023.02.16

එච්.එම්.එස්.පී.හේරත්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එච්.එම්.එම්.එච්.කඳානේගෙදර
තනතුර : ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2023.02.16
එච්.එම්.එම්.එච්. කඳානේගෙදර,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට,
පුත්තලම.

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		ඒසීඒ-සී
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තක්‍ෂ	
	2022	**නැවත ගලපන ලද 2021**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	260,185,335	208,453,679
අග්‍රිම ලැබීම්	2,814,365,000	4,111,132,000
අත්තිකාරම් අයකර ගැනීම්	84,814,379	100,952,932
තැන්පතු ලැබීම්	169,414,528	482,165,009
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,328,779,242**	**4,902,703,621**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	867,207,650	999,294,842
සහනාධාර සහ මාරුකිරීම්	7,661,055	304,906,761
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,732,718,834	2,907,897,226
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	55,223,500	-
අත්තිකාරම් ගෙවීම්	80,695,638	105,982,030
තැන්පතු ගෙවීම්	246,645,457	454,469,557
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,990,152,133**	**4,772,550,417**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**338,627,109**	**130,153,204**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	135,450	48,545
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**135,450**	**48,545**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	338,762,559	130,201,749
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**338,762,559**	**130,201,749**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(338,627,109)**	**(130,153,204)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ .

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත . අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි .

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත .

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා , මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ .

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ , පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ .

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී .

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ , පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ .

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් සමන්විත වේ .

ඒසිඒ -2

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 273 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පුත්තලම

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුළු වියදම	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්)
		(1)	(2)	(3)	(4)=(1)+(2)+(3)	(5)	(6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	915,000,000	-	(8,700,000)	915,000,000	875,630,955	39,369,045
				8,700,000			
	(2) ප්‍රාග්ධන	399,000,000	-	-	399,000,000	338,762,559	60,237,441
	උප එකතුව	**1,314,000,000**	**-**	**-**	**1,314,000,000**	**1,214,393,514**	**99,606,486**
වැඩසටහන (2)	(1) පුනරාවර්තන						
	(2) ප්‍රාග්ධන						
	උප එකතුව						
	මුළු එකතුව	**1,314,000,000**	**-**	**-**	**1,314,000,000**	**1,214,393,514**	**99,606,486**



වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 273 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පූන්තලම**

රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		
	(1)	(2)	(3)	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)	(8)	(9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පුනරාවර්තන වියදම්											
පුද්ගල පඩිනඩු											
1001 වැටුප් හා වේතන	509,000,000		(8,700,000)	500,300,000	489,466,784	-	-	-	-	-	489,466,784
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්	16,700,000			16,700,000	14,404,426	-	-	-	-	-	14,404,426
1003 වෙනත් දීමනා	237,500,000			237,500,000	223,371,993	-	-	-	-	-	223,371,993
ගමන් වියදම්											
1101 දේශීය	17,000,000			17,000,000	16,085,892	-	-	-	-	-	16,085,892
1102 විදේශීය											
සැපයීම්											
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය	13,050,000		2,600,000	15,650,000	15,644,485	-	-	-	-	-	15,644,485
1202 ඉන්ධන	19,800,000		3,100,000	22,900,000	22,426,272	-	-	-	-	-	22,426,272
1203 ආහාර පාන හා නිල ඇඳුම්	2,350,000			2,350,000	2,329,100	-	-	-	-	-	2,329,100
1204 වෛද්‍ය සැපයීම්											
1205 වෙනත්											
නඩත්තු වියදම්											
1301 වාහන	19,000,000			19,000,000	16,953,028	-	-	-	-	-	16,953,028
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	4,000,000		1,200,000	5,200,000	4,480,104	-	-	-	-	-	4,480,104
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2,500,000			2,500,000	2,456,097	-	-	-	-	-	2,456,097
සේවා											
1401 ප්‍රවාහන	600,000			600,000	588,710	-	-	-	-	-	588,710
1402 කැපැල් හා සන්නිවේදන	8,650,000		1,800,000	10,450,000	10,006,472	-	-	-	-	-	10,006,472
1403 විදුලිය හා ජලය	9,750,000			9,750,000	7,219,302	-	-	-	-	-	7,219,302
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	1,100,000			1,100,000	459,267	-	-	-	-	-	459,267
1406 කල්බදු වාහන සඳහා වූ පොලී ගෙවීම්											
1408 මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික											
1409 වෙනත්	43,500,000			43,500,000	42,077,969	-	-	-	-	-	42,077,969
මාරුකිරීම්											
1501 සුභසාධන වැඩසටහන්											
1502 විශ්‍රාමික ප්‍රතිලාභ											
1503 රාජ්‍ය ආයතන											
1504 සංවර්ධන සහනාධාර											
1505 සම්මාදම් සහ දායක මුදල්											
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	10,500,000			10,500,000	7,661,055	-	-	-	-	-	7,661,055
1507 පළාත් සභා සඳහා ප්‍රදානයන්											
1508 වෙනත්											
පොළී ගෙවීම්											
1601 දේශීය ණය සඳහා පොලී ගෙවීම්											
1602 විදේශීය ණය සඳහා පොලී ගෙවීම්											
1603 භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්											
වෙනත් පුනරාවර්තන වියදම්											
1701 පාඩු සහ කපාහැරීම්											
1702 අනපේක්ෂිත සේවා											
1703 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම											
මුළු එකතුව	**915,000,000**	**-**	**-**	**915,000,000**	**875,630,955**	**-**	**-**	**-**	**-**	**-**	**875,630,955**

මූලධන වියදම්											
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්											
2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	8,200,000			8,200,000	8,200,000						8,200,000
2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	500,000			500,000	230,880						230,880
2003 වාහන	7,000,000			7,000,000	5,986,660						5,986,660
මූලධන වත්කම් අත්පත් කර ගැනීම්											
2101 වාහන											
2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	2,000,000			2,000,000	1,890,748						1,890,748
2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	2,000,000			2,000,000	1,904,568						1,904,568
2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	22,000,000			22,000,000	21,998,816						21,998,816
2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම්											
2106 මෘදුකාංග සංවර්ධනය											
2108 කල්බදු වාහන සඳහා ණය මුදල ආපසු ගෙවීම්											
ප්‍රාග්ධන මාරුකිරීම්											
2201 රාජ්‍ය ආයතන											
2202 සංවර්ධන සහායන්											
2203 පළාත් සභා සඳහා ප්‍රදානයන්											
2204 විදේශයන්ට මාරු කිරීම්											
2205 රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන්											
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්											
2301 හිමිකම් දායක මුදල්											
2302 ණයදීම්											
හැකියා වර්ධනය											
2401 කාර්ය මණ්ඩල පුහුණු	1,300,000			1,300,000	495,370						495,370
වෙනත් මූලධන වියදම්											
2501 ප්‍රතිව්‍යුහගතකිරීම්											
2502 ආයෝජන											
2503 අනපේක්ෂිත සේවා											
2504 පළාත් සභා සඳහා දායකත්වය											
2505 ප්‍රසම්පාදන පෙර සූදානම් වීම්											
2506 යටිතල පහසුකම් සංවර්ධනය											
2507 පර්යේෂණ සහ සංවර්ධන											
2509 වෙනත්	356,000,000	-		356,000,000	298,055,517						298,055,517
මුළු එකතුව	**399,000,000**	**-**	**-**	**399,000,000**	**338,762,559**	**-**	**-**	**-**	**-**	**-**	**338,762,559**
මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව	**1,314,000,000**	**-**	**-**	**1,314,000,000**	**1,214,393,514**	**-**	**-**	**-**	**-**	**-**	**1,214,393,514**

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02.16

එච්.එම්.එම්.එච්. කඳාතේගෙදර,
ප්‍රධාන ගණකාධිකාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
පුත්තලම.

ඒසිඒ-3

2022 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පුත්තලම

වියදම් ශීර්ෂ අංකය : 273

රු.

අග්‍රිම ගිණුම් අංකය	2022 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය			අග්‍රිම ලැබීම්			අග්‍රිම පියවීම්			2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			2022 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය	2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
	1			2			3			4				
	නොපිය වූ උප අග්‍රිම	නොපිය වූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම් මගින්	මුදල් මගින්	එකතුව	නොපිය වූ උප අග්‍රිම ශේෂය	නොපිය වූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
312/21														
312/22	-	-	-	2,814,365,000	327,239,043	3,141,604,043	3,086,380,543	55,223,500	3,141,604,043	-	-	-	-	430,000

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2022.12.31 දිනට මුදල් ශේෂය	430,000.00
(2) වෙනත් හේතු -	-
	430,000.00

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද , නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න .

2022.12.31 දින හර ශේෂය වන 430,000.00 ක මුදල භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැර කර ඇත .

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි .



3. 5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.02.99	පොළිය - අනිකුත්	10,000,000.00	10,000,000.00	10,110,113.41	101.1%
2003.02.99	විකුණුම් හා ගාස්තු - විවිධ	200,000.00	520,000.00	337,304.36	65%
2003.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම	2,000.00	3,000.00	1,300.00	43.3%
2003.99.00	විකුණුම් හා ගාස්තු - අනිකුත් ලැබීම	8,000,000.00	8,770,000.00	18,631,958.69	212.45 %

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	915,,000,000	915,,000,000	875,630,955	95.7%
ප්‍රාග්ධන	399,000,000	399,000,000	338,762,559	85%

3.7 මු.රේ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වල නියෝජිතයෙක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා වියදම් විස්තරය/ඛාණ්ඩය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	සෞඛ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	**4.45**	**4.45**	**4.45**	100%
		වකුගඩු රෝග නිවාරණ	**2.62**	**2.62**	**2.62**	100%
		කාර්යාල උපකරණ මිලදී ගැනීම	**0.07**	**0.07**	**0.07**	99%
2	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	0.66	0.66	0.66	100%
3	ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන	**20.18**	**20.18**	20.18	100%
4	බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය	සාහිත්‍ය කලා මහෝත්සවය	**0.55**	**0.55**	**0.50**	91%
		තිරසර පුන්‍යග්‍රාම වැඩසටහන	**0.97**	**0.97**	**0.97**	100%
5	කෘෂිකර්ම අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	**25.13**	**25.13**	24.78	99%
		පොහොර සහනාධාරය	**227.47**	**227.47**	0.19	0%
6	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	**3.13**	**3.13**	**3.11**	99%
7	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	**5.29**	**5.29**	**5.282**	100%
		එක්දින පුහුණු වැඩමුළුව	**0.59**	**0.59**	**0.20**	34%
8	කර්මාන්ත අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	**2.43**	**2.43**	**2.35**	97%
		ප්‍රාග්ධන වියදම්	**0.08**	**0.08**	**0.07**	88%
9	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	සංචාරක බංගලාවේ පුස්තකාල පොත් ගැනීම	**0.25**	**0.25**	**0.25**	100%
		සංචාරක බංගලා පුනරාවර්තන වියදම්	**1.75**	**1.75**	**1.75**	100%
		සංචාරක බංගලාවේ අලුත්වැඩියා	**0.03**	**0.03**	**0.03**	100%
		පුනරාවර්තන වියදම්	**532.94**	**532.94**	**530.84**	100%
		මූලධන වත්කම් පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	**0.97**	**0.97**	**0.50**	51%
10	පරිසර අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	**0.52**	**0.52**	**0.52**	99%
		හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණ වැඩසටහන	**1.44**	**1.44**	**1.44**	100%
		සුරකිමු ගංගා ව්‍යාපෘතිය	**0.03**	**0.03**	**0.03**	100%

11	ඉඩම් අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	5.29	5.29	5.28	100%
12	කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	1.36	1.36	1.33	98%
		සෞභාග්‍යා සංවර්ධන වැඩසටහන	68.28	68.28	67.98	100%
		සමෘද්ධි අරුණළු ව්‍යවසාය හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	15.10	15.10	10.08	67%
		දිරිය මංපෙත ආදායම් වැඩසටහන	0.49	0.49	0.49	100%
		ආබාධිත දීමනා	103.90	103.90	103.90	100%
		වකුගඩු රෝගීන් සඳහා දීමනාව	46.92	46.92	46.91	100%
		ගුරු අභිමානී	14.85	14.85	14.54	98%
		වැඩිහිටි දීමනා	361.16	361.16	360.98	100%
		ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ දීමනාව	144.14	144.14	129.24	90%
		ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු	0.51	0.51	0.51	100%
		අධි අවධානම් සහිත දරුවන් සඳහා ආධාර ලබා දීම	0.19	0.19	0.18	92%
		පෙර පාසල් දරුවන් සඳහා උදැසන ආහාර වේල ලබාදීම	21.52	21.52	2.62	12%
13	තාක්ෂණ අමාත්‍යාංශය	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේනතුවේ ප්‍රාදේශීය ඒකකයේ මාසික විදුලි බිල්පත් ගෙවීම	0.39	0.39	0.36	92%
14	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	1.38	1.38	1.29	93%
		ප්‍රගති සමාලෝචන රැස්වීම්	0.21	0.21	0.21	100%
15	තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	0.69	0.69	0.65	94%
		ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වන වැඩසටහන් සඳහා	2.04	2.04	2.04	100%
16	වාරිමාර්ග අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	1.09	1.09	1.09	100%
		අමාත්‍යාංශ වියදම්	0.78	0.78	0.74	94%
17	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	11.54	11.54	11.23	97%
		දහම් පාසල් ගුරු දීමනා	8.87	8.87	8.87	100%
18	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	0.02	0.02	0.02	88%
19	ක්‍රිස්ත්‍රයානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	0.33	0.33	0.33	100%
20	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	1.59	1.59	1.57	99%
		කලාකරු සුවදම් - 2022 වැඩසටහන	1.01	1.01	1.01	100%
		දොළොස්මහේ පහන වැඩසටහන	0.10	0.10	0.10	100%

21	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	0.11	0.11	0.10	98%
22	සමාජ සේවා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	13.15	13.15	12.81	97%
		ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන	0.26	0.26	0.26	100%
		අබාධ සහිත වූවන්ගේ ජාතික ආධුනික මළල ක්‍රීඩා උළෙල	0.16	0.16	0.16	100%
23	පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව	පාසල් උපකරණ සම්පත් සංචිත පවත්වා ගැනීම	0.61	0.61	0.61	100%
		ලෝක ළමා දින වැඩසටහන	0.52	0.52	0.51	99%
		පුනරාවර්ථන වියදම්	0.41	0.41	0.39	96%
24	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	දක්ෂතා හඳුනා ගැනීමේ වැඩසටහන	0.43	0.43	0.43	100%
		ජීවිතාරක්ෂක නිලධාරී පුහුණු පාඨමාලාව	0.35	0.35	0.35	100%
		පුනරාවර්ථන වියදම්	0.13	0.13	0.12	92%
25	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	17.36	17.36	17.31	100%
26	ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	1.61	1.61	1.54	96%
27	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	සිවිල් විශ්‍රාම වැටුප්	15.51	15.51	15.35	99%
		පුනරාවර්ථන වියදම්	1.91	1.91	1.87	98%
		වැන්දඹු විශ්‍රාම වැටුප්	6.29	6.29	6.24	99%
28	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වන අලි හානි වන්දි	1.94	1.94	1.94	100%
29	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	0.03	0.03	0.03	98%
30	පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව	1980-1982 කාලයේ පෞද්ගලීකරණය කරන ලද ව්‍යාපාරවල සේවකයින්ගේ මාසික දීමනා ගෙවීම	7.44	7.44	7.30	98%
31	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	0.82	0.82	0.65	80%
32	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	0.02	0.02	0.02	100%
33	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	0.48	0.48	0.47	98%
		සංවර්ධන ව්‍යාපෘති	0.51	0.51	0.50	98%
		කාර්යාල අළුත්වැඩියා	0.03	0.03	0.03	82%
34	මිනිස්බල සහ රැකිරක්ෂා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	0.66	0.66	0.55	82%
		රැකියා පොළ වැඩසටහනේ වෘත්තීය පොළ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම	0.09	0.09	0.09	100%
35	අධිකරණ මානව හිමිකම් සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	සිංහල දෙමළ භාෂා සන්නිවේදන පුහුණු පාඨමාලාව	2.91	2.91	2.91	100%
		දමිසර සහජීවන සංගමය	0.10	0.10	0.10	100%
		පුනරාවර්තන වියදම්	0.10	9.85	9.80	99%
36	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	253.21	253.21	246.66	97%
37	රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරන රාජ්‍ය අමාත්‍යාංශය	නැවත පදිංචි කිරීම සඳහා නිවසක් සහිත ඉඩමක් ලබා ගැනීම	1.60	1.60	1.60	100%
		ස්වභාවික ආපදා නිසා සිදු වූ නිවාස හානි වන්දි	3.47	3.47	3.46	100%
		පුනරාවර්තන වියදම්	21.70	21.70	21.57	99%
			1,999.17	2,008.92	1,730.03	86%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට හාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,379,687,254	1,379,687,254	තක්සේරු කිරීමට යොමුකර ඇත.	90%
9152	යන්ත්‍රෝපකරණ	336,484,525	336,484,525	.....	100%
9153	ඉඩම්	1,057,657,000	1,057,657,000	.....	100%
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NWCG/PT/A/PUT.D.S./02/22/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 24 දින

25 MAY 2023

ගණන්දීමේ නිලධාරි,
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලා
ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩ
වාර්තාව.

.යථෝක්ත මූල්‍ය ප්‍රකාශනය සහතික කර ඉංග්‍රීසි හා දෙමළ පිටපත් ද සමඟ ඉදිරිපත් කරමි.

එස්. පී. වීරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එස්.පී.වීරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත්:-
01. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NWCG/PT/A/PUT.D.S./02/22/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි දින

ගණන්දීමේ නිලධාරී,
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 273 – පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනමව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ (අදාළ වන පරිදි) වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා

අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් ඔවුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල විධිහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල විධිහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශයන් පහත සඳහන් ඡේද සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
3.5 (අ)	අලුත්වැඩියා කළයුතු නිල නිවස වාසස්ථානයට සුදුසු අයුරින් පිළිසකර කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතුයි.	3.4 (ඒ)
3.5 (ආ)	ප්‍රමාදයකින් තොරව ඉඩම ලබාගෙන අදාල කටයුතු සම්පූර්ණ කළයුතුය.	3.4 (ඌ)
3.7 (අ)	14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කළයුතුව තිබිය දී ඒ අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබූ බැවින්, ඒ පිළිබඳව පරීක්ෂා කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ක්‍රියාමාර්ග ගතයුතුය.	3.5(අ) i.
3.8	අදාල නිර්දේශ ලබාගත යුත්තේ ශක්‍යතා අධ්‍යයන අවස්ථාවේ දී වන අතර, ලබාදෙනු ලැබූ නිර්දේශ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල ද යන්න සළකා ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතුය.	3.4(ඍ)
3.9 (අ)	වැඩිපුර ගෙවීම් වගකිව යුතු නිලධාරීගෙන් අයකල යුතුය.	3.5(අ)
3.9 (ආ)	කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	2.3

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/GFS/01/01/08 – Volume දරන 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු හඳුනාගත් ඉඩම් සහ ගොඩනැඟිලි තක්සේරු කරවා ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු බවට හඳුනාගත් ග්‍රාම නිලධාරී කාර්යාල 49, නිල නිවාස 06, රජයේ පොදු ගොඩනැඟිලි 13 ක් හා ප්‍රජා ශාලාවක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ට අයත් විධායක සහ විධායක නොවන එකතුව වර්ග අඩි 12693 ක් වූ නිල නිවාස 11 ක් සහ නිල නිවස පිහිටි ඉඩම්වල එකතුව අක්කර 6.6 රූඩ් 02 පර්චස් 12.7 ක් වූ ඉඩම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාදම්පේ ගොවිජන සේවා කාරක සභාව භාවිතා කර නැවත භාර දී තිබූ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැඟිල්ල හා එය පිහිටි ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර, තක්සේරු කර ගිණුම්ගත කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන තිබූ වත්කම් ලැයිස්තුවට ද එය ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ බෝට්ටු හා එන්ජිමක්, ජීවිතාරක්ෂක කබා 18 ක්, මෙගා ෆෝන් එකක්, වතුර ටැංකි 08 ක්, වතුර මෝටර් 04 ක් හා ට්‍රැක්ටර් සමඟ බවුසර් 08 ක් පවරා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් 13 ක් හා ට්‍රේලර් 13 ක්ද, ලොරි බවුසර් 09 ක්ද පවරා ගෙන ගිණුම් ගත කර නොතිබුණි.

1.6.2 තැන්පතු ගිණුම් ශේෂ

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් එකතුව රු.3,603,030 ක් වර්ෂ 02 – 05 ත් අතර, කාලයක සිට ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනෙකුත් යන්ත්‍ර හා උපකරණ ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.176,559,075 ක් ද භාණ්ඩාගාර පොත් අනුව රු.176,905,125 ක්ද වීමෙන් රු.346,050 ක වෙනස්වීමක් නිරීක්ෂණය විය.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විදුලි උපකරණ ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

2022 වර්ෂයේ මුළු ආදායම් සහ ආදායම් නොවන ලැබීම් රු.3,051,880,581 ක් වූ අතර ඉන් භාණ්ඩාගාර අග්‍රිම ලෙස ලැබී තිබූ මුදල් රු.2,814,365,000 ක් විය.එය මුළු ලැබීම් වල ප්‍රතිශතයක් ලෙස 92.2 ක් විය. තවද රු.55,223,500 ක් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ අතර එය භාණ්ඩාගාර අග්‍රිම ලෙස ලද මුදලින් සියයට 1.96 ක් විය. 2022 වර්ෂයේ මුළු වියදම් රු.1,519,257,892 ක් වූ අතර එය ශුද්ධ ආදායම් හා ආදායම් නොවන ලැබීම් වලින් සියයට 49.8 කි විය.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී වැඩසටහන් 01 වැය විෂය 1001 වැටුප් හා වේතන වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනයෙන් රු.8,700,000 ක් මුදල් රෙගුලාසි 66/69 යටතේ එම වැඩ සටහනේ පුනරාවර්තන වැය විෂයයන් 04 කට මාරු කර තිබුණ ද, එලෙස මාරු කරගන්නා ලද රු.8,700,000න් සියයට 18.8 ක් වූ රු.1,637,152 ක් ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයය 1404 බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු වාර්ෂික ප්‍රතිපාදනය රු.1,100,000 න් රු.640,733 ක් හෙවත් සියයට 58.25 ක් ඉතිරි වී තිබුණු අතර, එයට හේතුව පළාත් පාලන ආයතන බිල්පත් ඉදිරිපත් නොකිරීම ලෙස දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වගකීම් නිෂ්චය කරගෙන බැඳීම් හා බැරකම් ප්‍රකාශය තුළ දක්වා නොතිබුණි.

(ඇ) මු.රෙ.50 අනුව ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණ ලෙස හා නිවැරදිව සකස් කළයුතු බව දක්වා තිබුණ ද, වැය විෂය 1403 විදුලිය හා ජලය සඳහා වර්ෂ ගණනාවක සිට අධි ඇස්තමේන්තු සකස් කර තිබූ අතර, 2022 වර්ෂයේ ඉතිරිය රු.2,530,698 ක් හෙවත් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 26 ක් වී තිබුණි.

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

2019 – 2021 කාලය තුළදී රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගැනීමට 2020/21 මහ කන්නය තුළදී කරුවලගස්වැව, ආණමඩුව හා නවගත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වී මෝල් හිමියන් 14 දෙනෙකුට රු.100,161,424 ක මුදලක් ලබාදී ඇති අතර, එම මුදලින් අපේක්ෂිත සහල් ප්‍රමාණය වූ සහල්

කිලෝග්‍රෑම් 1,294,700.23 ක් වෙනුවට කිලෝග්‍රෑම් 872,198 ක් ලැබී තිබුණු අතර, රු.32,685,875 ක් වටිනා සහල් කි.ග්‍රෑ. 422,502 ක් ලැබී නොතිබුණි.

2021 යල කන්නය තුලදී වී මෝල් හිමියන් 19 දෙනෙකුට රු.77,880,000 ක මුදලක් රජයෙන් ලබාදී තිබූ අතර, ලැබිය යුතු සහල් ප්‍රමාණය වූ කිලෝ ග්‍රෑම් 1,006,687ක මුළු සහල් ප්‍රමාණයම සපයා නොතිබුණු අතර, 2020/21 මහ කන්නයේ දී සහල් කිලෝ ග්‍රෑම් 380,052 ක් අඩුවෙන් සැපයූ වී මෝල් හිමියන් 10 දෙනෙකුට නැවත 2021 යල කන්නේ දී ද රු.45,188,000 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් විසින් ලබා දී තිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	මුදල් රෙගුලාසි	
i.	මුදල් රෙගුලාසි 109	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන අනතුරු 13 කට අදාලව කපා නොහල අලාභහානී වල එකතු වටිනාකම රු.2,384,780 ක අගයක් සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.
ii.	මුදල් රෙගුලාසි 109 (1)	හානියෙන් අයකර ගතයුතු උපරිම වටිනාකම සහ අයකර ගැනීමට තීරණය කරන මුදලත් අතර යම් වෙනසක් ඇතොත් ඒ වෙනස පොතෙන් අස්කර දැමීමට, පොතෙන් අස්කිරීමේ නියෝගයක් අනුව කටයුතු කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හානි පාඩු ලේඛනය හා ඒ ආදී ලිපිලේඛන අනුව වාහන අනතුරු 15 කට අදාලව රු.715,483 ක වටිනාකමක් ඉහත නියෝගය රහිතව පොතෙන් කපාහැර තිබුණි.
iii.	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)	දින 10 ක් ඇතුළත ලබාගත් තත්ත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වනාතවිල්ලුව, පල්ලම, පුත්තලම හා කරුවලගස්වැව, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් රු.384,355 ක්, රු. 15,000ක්, රු.210,000 ක්, රු.105,600 ක්, රු.240,250 ක් වූ අග්‍රිම සමබන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

i.	2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008	රාජ්‍ය ආයතනයක් වෙතින් සේවා ලබන මහජනතාවට අවශ්‍යතාවන් කඩිනමින්ම, කාර්යක්ෂමව ගුණාත්මකව හා අඛණ්ඩව ඉටුකරනු ලබන බවට ලිඛිත බැඳීමක ස්ථාපිත කිරීමේ අරමුණින් සියලුම රාජ්‍ය ආයතන විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දියයුතු බවට අමාත්‍ය මණ්ඩලය නීරණය කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැන්වා තිබුණු අතර, මාස 06 ක් ඇතුළත සියළු රාජ්‍ය ආයතන ඒ අනුව කටයුතු කිරීම අපේක්ෂා කර තිබුණ ද, ඊට අනුකූලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.
ii.	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය	ආයතන ප්‍රධානී ඇතුළුව සියළුම සේවකයින් තම පැමිණීම් ඇඟිලි සළකුණු යන්ත්‍රයක් හා ලේඛනයක් මඟින් සනාථ කළයුතු බව දන්වා තිබුණ ද, මහවැව, ආණමඩුව හා කරුවලගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය හරහා සටහන් කිරීමකින් තොරව පැවතුණ අතර පැමිණීම් හා පිටවීම් ලේඛනයේ තොරතුරු මත අනිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි.
iii.	2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කාර්ය පරිපාටික රීති 01 වන කාණ්ඩයේ XVII පරිච්ඡේදයේ 202 වගන්තිය හා 2001 අගෝස්තු 22 දිනැති හා අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටියේ 2.2.2 ඡේදය ප්‍රකාරව එකම සේවා ස්ථානයේ වසර 05 ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු කළයුතු වුවද, මහකුඹුක්කඩවල, මුන්දලම, පුත්තලම, කරුවලගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2022 දෙසැම්බර් 31දිනට වසර 5 - 9 ත් අතර සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් එකතුව 347 දෙනෙකු සම්බන්ධයෙන් යථෝක්ත ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛනයේ 04 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම ගිය හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් අත්තිකාරම් බී ගිණුමෙන් නොපෙන්වීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඊට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මියගිය නිලධාරියෙකුගේ රු.221,015 ක විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.66,134 ක ණය ශේෂ නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වැඩ තහනම් කර නිබූ නිලධාරීන් 04 දෙනකුගෙන් අයකර ගතයුතු එකතුව රු.325,611 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක වසර 01 ත් 14 ත් අතර, කාලයක සිට සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.119,800 ක් හා මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.160,000 ක මුදල් වංචාව කල නිලධාරියා ලබාගෙන නිබූ රු.231,600 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොනිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොනිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නිබුණ ද, ඒ තුල ඇතුළත් කාර්යයන්හි ප්‍රගතිය මැන බැලීමට ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොනිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ග්‍රාමීය හා ප්‍රාදේශීය ජල සම්පාදන ව්‍යාපෘති රාජ්‍ය අමාත්‍යාංශයේ ග්‍රාමීය ජල සම්පත් හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 435 ක් සඳහා වැසිකිලි ඉදිකිරීමට එක් පවුලකට රු.15,000 ක උපරිමයකට යටත් ව ප්‍රතිපාදන අනුමත කර නිබුණ ද, 2022 වර්ෂය අවසාන වනවිට වැසිකිලි 297 ක් පමණ සම්පූර්ණ කර නිබුණි.

(ආ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නිල් අඩිය වසමෙහි අඩක් නිමකර නිබූ ප්‍රජා ශාලා ගොඩනැඟිල්ල සම්පූර්ණ කිරීම සඳහා සමඟි කාන්තා කාර්ය සංවිධානය සමඟ රු.1,595,632 ක මුදලකට 2022 මාර්තු 21 දින ගිවිසුමකට එළඹ නිබුණු අතර, එම ගිවිසුම අනුව ඉදිකිරීමට ලබා දී නිබුනේ දින 10 ක් වැනි සුළු කාලයකි. පසුව තව දින 14 කින් කාලය දීර්ඝ කර නිබුණ ද, කොන්ත්‍රාත්කරු භාවිතයට ගතහැකි මට්ටමට වැඩ නිමකර නොනිබුණි. එසේම දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (සැලසුම්ගේ) 2022 සැප්තැම්බර් 26 දිනැති පුත්තලම ප්‍රාදේශීය ලේකම් ඇමතූ ලිපිය අනුව ප්‍රජාශාලාව සම්පූර්ණයෙන් ම වැඩ නිමකර ඇත්නම් පමණක් ගෙවීම් කරන ලෙස දක්වා නිබුණ ද, එම නිර්දේශයෙන් බැහැරව ප්‍රාදේශීය ලේකම් විසින් කොන්ත්‍රාත්කරුට රු.350,000 ක් ගෙවා නිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 වර්ෂය සඳහා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබූ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 15 න් ව්‍යාපෘති 05 ක් පාසල්වල ඇතුල්වීමේ පුවරු සකස් කිරීමට ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා එක් ව්‍යාපෘතියකට රු.776,000 බැගින් රු.3,880,000 ක් වැයකර තිබුණි. එසේ ම සෑම ඇතුල් වීමේ පුවරුවකම ඉහළින් පාසලේ නම සඳහන් කර තිබූ පුවරුවක් සවිකර තිබූ අතර, ඒ සඳහා රු.80,000 ක් බැගින් රු.400,000 ක් වැයකර තිබුණි.මෙම සියලු පාසල් ග්‍රාමීයව පිහිටා තිබූ දුෂ්කර පාසල් වන අතර විශාල පරිමාණයේ ඇතුල්වීමේ පුවරුවක් ඉදිකිරීමට වඩා ප්‍රවුඛතාවය ලබාදිය යුතු සංවර්ධන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකර තිබූ නව කාර්යාල ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කටයුතු අවසන් කර තිබුණ ද, එහි පවතින අඩුපාඩු ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් හඳුනාගෙන තිබූ අඩුපාඩු 22 න් පඩිපෙළ ඉදිකිරීම ඇතුළු වැඩ විෂයය දෙකක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.1.4 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසමක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 03 ක් වූ ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 63ක් නිෂ්පාදන/ ස්වයං රැකියා/ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය සඳහා රු. 8,679,000 ක් යටතේ ඇස්තමේන්තු සකස් කර තිබුණ ද, ඉන් ක්‍රියාත්මක කර තිබුණේ රු.3,168,440 ක් වූ ව්‍යාපෘති 21 ක් පමණි. ඒ අනුව ව්‍යාපෘති 42 ක් අවලංගු කර තිබුණි.

(ආ) ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසමක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 03 ක් වූ ප්‍රතිපාදන යටතේ වටිනාකම රු.10,950,000 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 16 ක් සැලසුම් කර තිබුණ ද, ඉන් ප්‍රතිපාදන වටිනාකම එකතුව රු.5,000,000 ක් වූ ව්‍යාපෘති 07 ක් අවලංගු කර තිබුණි.

(ඇ) ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පළාත්පාලන කොට්ඨාශයට වෙන්කළ රු.මිලියන 04 ප්‍රතිපාදන යටතේ රු.3,245,000 ක් වටිනා ව්‍යාපෘති 29 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, ඉන් 22 ක් අවලංගු කර වියදම් රු.965,184 ක් වූ ව්‍යාපෘති 07 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසමක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 03 ක් වූ ප්‍රතිපාදන යටතේ මාර්ග සංවර්ධන / ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 06 ක්

රු.5,450,000 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීම සැලසුම් කර තිබුණ ද, වියදම රු.1,115,300 ක් වූ ව්‍යාපෘතිය 03 ක් පමණක් ක්‍රියාත්මක කර ප්‍රතිපාදන මුදල රු.3,300,000ක් වූ ව්‍යාපෘති 03 ක් අවලංගු කර තිබුණි.

(ඉ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ සභාපතිවරයාට වෙන් කල රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන යටතේ ව්‍යාවසායක සංවර්ධන ව්‍යාපෘති 35 ක් රු.2,340,000 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, ඉන් වියදම රු.766,300 ක් වූ ව්‍යාපෘති 06 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කොට්යාශයේ ග්‍රාම නිලධාරී වසමක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 03 ක් වූ ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘති 09 ක් රු.1,800,000 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණ ද, ඉන් ප්‍රතිපාදනය රු.1,400,000 ක් හා වියදම රු.1,358,000 ක් වූ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර ව්‍යාපෘති 03 ක් අවලංගු කර තිබුණි.

(උ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ප්‍රජාපාලින හා නිෂ්පාදන සේවා ගම්මාන සඳහා ජීවනෝපාය සංවර්ධනය මූලික යටිතල පහසුකම් නැංවීම, ධාරිතා සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන් හි ආයෝජනය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ මුදල් ග්‍රාම ශක්ති සමිතිවලට නිකුත් කර තිබුණු අතර, නිකුත් කර තිබූ මුදල්වලින් මාදම්පේ, නාත්තන්ඩිය, ආණමඩුව හා මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවලට අයත් අක්‍රිය සමිති 45 ක මුදල් ශේෂයන්ගේ එකතුව රු.23,913,494ක් වසර 04 ක කාලයක සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,969,975 වැයකර වර්ෂ 05 කට පමණ පෙර ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 04 ක් අපේක්ෂිත ප්‍රතිලාභ ලබානොගෙන විනාශ වෙමින් පවතින බව ද රු.3,876,375 ක් වැයකර වර්ෂ 05 කට පමණ පෙර ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද දහම් පාසල් ගොඩනැඟිලි 04 ක් හා ආරාමයක වැසිකිලි පද්ධතියක් මේ දක්වා අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා කළ හැකි තත්ත්වයට සම්පූර්ණ වී නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මධ්‍යම රජය සතු ඉඩම්වල අයිතිය අනෙකුත් දෙපාර්තමේන්තුවලට පැවරීම සම්පූර්ණ නොවී තිබිය දී වෙනත් දෙපාර්තමේන්තු මඟින් භාවිතා වන ඉඩම්වල අනවසර ක්‍රියාකාරකම් වාර්තා වූ විගස ඒ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කිරීම පමණක් සිදුකරනු ලබන අතර, පසුවිපරමක් සිදුකර වසර අග වාර්ෂික සමාලෝචන වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ආ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පුත්තලම, මාදම්පේ, දංකොටුව, ආරච්චිකට්ටුව හා මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සපයා තිබූ ට්‍රැක්ටර් බවුසර් 07ක් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් නිල නිවස 2021 වර්ෂයේ දී රු.1,504,322 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණ ද, වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඉ) 2014 වර්ෂයේ සිට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රු.9,875,000 ක් වටිනා නිල නිවාස 03 ක් 2023 මාර්තු මාසය වනවිට නිශ්කාර්යව පැවතුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යලයවලට අයත් නිල නිවාස පරීක්ෂාවේ දී මහකුඹුක්කඩවල, ආණමඩුව, ආරච්චිකට්ටුව, නාත්තන්ඩිය, මුන්දලම, කල්පිටිය හා හලාවත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවලට අයත් නිල නිවාස 07 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිට නිශ්කාර්යව පවතින බවට නිරීක්ෂණය විය.

(උ) වනාතවිල්ලුව, මුන්දලම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු බවුසර් 03 ක් හා කැබ රථ දෙකක් දිගු කාලයක සිට අලුත්වැඩියාව සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි.

(ඌ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2022 මැයි මස 05 වැනි දින හා ඔක්තෝබර් 13 වන දින මිලදී ගෙන තිබූ 215 x 75 x 15 වර්ගයේ ටයර් 30 ක් හා එම දිනයන්වල දී ම මිලදී ගෙන තිබූ 265 x 70 x 16 වර්ගයේ ටයර් 27 ක් විගණන දිනය වූ 2023 මාර්තු 14 වන දින වන විටත්, ගබඩාවේ ගොඩ ගසා තිබුණි. එසේ ම මෝටර් රථයක් ධාවනයේ දී එහි ආරක්ෂාව එහි ඉන්ධන කාර්යක්ෂමතාවය සඳහා එම වාහනයේ යොදා තිබෙන ටයරයේ නිෂ්පාදිත දිනය වැදගත් වුවද, විගණනය සඳහා ඉහත ටයර්වල නිෂ්පාදිත වර්ෂය සහ සනිය සනාථ කිරීමට ගබඩා භාර නිලධාරී හා මිලදී ගැනීම් සිදුකරනු ලැබූ නිලධාරියාට නොහැකි විය.

(එ) මුදල් රෙගුලාසි 751 (1) සඳහන් පරිදි ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ලැබීම් පැත්තේ ඇතුළත් වියයුතු අතර, ඒ ලැබීම් මුදල් රෙගුලාසි 752 සඳහන් බඩු ලේඛන වවුචර්වලින් හෝ වෙනත් නිශ්චිත ලිපිලේඛනවලින් හෝ තහවුරු වියයුතු වුවද, මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 09 දින විගණන පරීක්ෂණ අවස්ථාවේ දී වත්කම් විෂයයන් 10 කට අදාල භාණ්ඩ ඒකක 48 ක් සම්බන්ධව එම අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

3.3 අනාර්ථික ගනුදෙනු

දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 252 – 9874 දරන සංචිත වාහනයේ ගියර් පෙට්ටිය අලුත්වැඩියාව සඳහා රු.395,000 ක් ගෙවා තිබුණු අතර, බිල්පතට අනුව සවිකර තිබූ අමතර කොටස් සඳහා වෙන වෙනම මිල

ගණන් සඳහන් නොකර එක මිලක් ලෙස රු.360,000 ක් ද දක්වා තිබුණු බැවින්, අමතර කොටස්වල මිල ගණන්වල සාධාරණත්වය පරීක්ෂා කල නොහැකි විය. එසේම අමතර කොටස් මිලදී ගෙන තිබූ ආයතනයෙන් නිකුත් කරන ලද බිල්පත ඉදිරිපත් කර නොතිබුණ අතර, අලුත්වැඩියාව සඳහා වගකීම් කාලය නීරණය කරන ලද ගනාථ කිරීම විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොටියාශ සංවර්ධනය යටතේ පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් වැඩ අවසන් වටිනාකම රු.259,601ක් වූ අඩම්මන ප්‍රජාශාලාවේ වැට ඉදිකිරීම යටතේ අවසාන බිල්පත් අනුව වැටෙහි දිග මීටර් 116 ක් සඳහා එක් මීටරයකට රු.2,234 ක් බැගින් රු.259,144 ක් ගෙවීම් කර තිබුණ ද, වැටෙහි දිග භෞතික පරීක්ෂාවේ දී මීටර් 106.5 ක් වූයෙන් මීටරයකට රු.2,234 බැගින් මීටර් 9.5 කට රු.21,223 ක් වැඩිපුර ගෙවා තිබුණි. විගණනය පෙන්වාදීමෙන් පසු පිළිතුරට අනුව වැඩිපුර ගෙවූ මුදල ආපසු අයකරගෙන තිබුණ මුත්, අදාල සංවර්ධන නිලධාරීන් ක්ෂේත්‍ර නිලධාරීන් හා ව්‍යාපෘති පරීක්ෂාව ලෙස දක්වා ගමන් වියදම් හා නිවාඩු දින වැටුප් ලබාගන්නා නිලධාරීන් නිසි පරිදි රාජකාරී ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වශයෙන් ප්‍රාදේශීය ලේකම් සහභාගී වූ ප්‍රසම්පාදන තීරණගත් දිනයන්වලදී ම ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නිරත වූ බව දක්වමින් කරුවලගස්වැව හා පුත්තලම යන ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සංයුක්ත දීමනා වශයෙන් රු.9,000 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) "අයවැයෙන් වැඩ ලක්ෂයක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ දී කුඩාමැදවච්චිය පාසල වටා ඉදිකර තිබූ වැටෙහි දිග මීටර් 205.6 ක් වූ අතර, ගෙවීම් වාර්තාව අනුව එක් මීටරයකට රු.2,234 ක් බැගින් මීටර් 217 කට ගෙවීම් කර තිබුණි. ඒ අනුව රු.25,468 ක් වැඩිපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.

(ඈ) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කිරිගව පාලනය වැඩසටහන යටතේ සාලියවැව වසමෙහි ප්‍රතිලාභීන් දෙදෙනෙකුට එක් උපකරණයක් රු.110,000 ක් වටිනා කිරිදොවන මැෂින් දෙකක් 2022 මුල් කාර්තුවේ ලබාදී තිබුණ මුත්, 2023 පෙබරවාරි වන විටත්, භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර, පිළිතුරට අනුව දැනට භාවිතා කරන බව දන්වා ඇති නමුත්, විධිමත් පරීක්ෂණයකින් තොරව කිරි ගොවීන් තෝරාගෙන තිබූ බවත් නිරීක්ෂණය විය.

(ඉ) ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය ප්‍රකාරව යම් නිලධාරියෙකු විසින් සිදුකරන ලද විෂමාචාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයකට අදාලව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය, එම පරීක්ෂණය ආරම්භ කර මාස 06 ක් ඇතුළත නිමකල යුතු හෝ අමතර කාලයක් අවශ්‍ය වනවිට ප්‍රමාණවත් කරුණු දක්වා විනය බලධාරියාගේ

අනුමැතිය ඒ සඳහා ලබාගත යුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් සංවර්ධන නිලධාරියෙකු හට අදාල චෝදනා පත්‍රය 2020 ජූලි 29 නිකුත් කර 2021 මැයි මස 03 දින ඊට අදාල විනිශ්චය සභා පත්කර තිබුණ ද, විනය පරීක්ෂණ කටයුතු විගණිත දින වනවිටත් අවසන් කර නොතිබුණි. එසේ ම 2022 ජූනි 30 දිනැති‍ව කාර්මික නිලධාරීට අදාලව නිකුත් කල චෝදනා පත්‍රය සම්බන්ධව විනය පරීක්ෂණ කටයුතු කිරීමට මේ වනවිටත්, විනිශ්චය සභාවක් පත්කර නොතිබුණි.

(ඊ) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන සහකාරවරයෙකු හට අදාලව මහජන පැමිණිලි ඔස්සේ හඳුනාගත් රජයේ කොන්ත්‍රාත් සිදු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ චෝදනාවට අදාලව 2020 අගෝස්තු 31 දින හාරදුන් මූලික විමර්ශනයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ කර තිබූ අතර, 2022 පෙබරවාරි 11 දින එම චෝදනා පත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව මාස 10 ක් ඉකුත් වීමෙන් පසු 2022 දෙසැම්බර් 26 දින ඊට අදාල ඒක පුද්ගල විනිශ්චය සභාව පත්කර තිබුණද 2023 මාර්තු 31 වන විටත්, අදාල පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(උ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වෙන්නප්පුව, ආණමඩුව හා ආරච්චිකට්ටුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනට අදාල නිලධාරීන් 05 දෙනෙකු සඳහා වන මූලික විමර්ශන නිර්දේශයන් තුළින් චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට නියම කර තිබුණ ද, විගණිත දින වන තෙක් එම නිලධාරීන්ට අදාලව චෝදනා පත්‍ර නිකුත් කර නොතිබුණි.

(ඌ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වර්තමාන තක්සේරු වටිනාකම රු.255,800,000 ක් වූ නිල නිවාස 08 පිහිටි අක්කර 01 යි රූඩ් 02 යි, පර්චස් 14.7 ක් වූ ඉඩම පුත්තලම නගර සභාව විසින් ඉදිකරනු ලබන ඇල්ෆා වෙළඳ සංකීර්ණය හා එහි රථවාහන අංගනය සඳහා පුත්තලම නගර සභාවට පවරා ගෙන ඒ වෙනුවට පුත්තලම ඩිපෝව අංගනය අසල නගර සභාවට අයත් ඉඩමෙන් අක්කර 01 ක් ලබාදී, නිල නිවාස 08 හි වර්තමාන තක්සේරු වටිනාකමට සමාන නිල නිවාස 04 ක් ඉදිකිරීමට අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදීමට එකඟතාවය ලබාගෙන තිබුණු අතර, පුද්ගලයින්ට පදිංචියට සුදුසු තත්ත්වයේ ඇති මෙම නිල නිවාස 08 න් 05 ක තක්සේරු කිරීමටත් පෙර කඩා ඉවත් කර තිබුණි. එසේ ම 2023 මාර්තු වන විටත් ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(එ) 1999 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 9 ක් වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදී තිබුණු අතර, එයින් නිවාස 08 කින් මේ දක්වා මාසික කුලී ගාස්තු අයකර ගෙන නොතිබුණි. ආපදා කළමනාකරණ අංශය වෙත ලබාදී තිබූ නිල නිවාස 2022 වර්ෂයේ දී රු.1,280,862 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණු මුත් ගාස්තු අයකීමකින් තොරව ලබාදී තිබුණි.

(ඒ) 2022 දෙසැම්බර් 31 දින වනවිට නිල නිවසක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2019 ජනවාරි මාසයේ සිට නිල නිවසක් ඉල්ලුම් කර සිටි නිලධාරීන් 20 දෙනෙක් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොරොත්තු

ලේඛනයෙහි සිටිනමුත්, නිල නිවාසවල වසර 05 ඉක්මවා පදිංචි වී සිටින නිලධාරීන් 07 ක් ඒවායෙහි වර්තමානය වන විටත්, පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ඔ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට වගකීම් කාලය අවසන් වූ ව්‍යාපෘති 18 කට අදාලව එකතුව රු. 5,816,107 ක රැඳවුම් මුදල් නිදහස් කර නොතිබුණි.

(ඕ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 අතුරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අදාලව ව්‍යාපෘති 595 ක් යටතේ නිදහස් කලයුතු රු.36,519,589 ක වටිනාකම්න් යුත් රැඳවුම් මුදල් 2022 දෙසැම්බර් 31 දින විටත් නිදහස් කර නොතිබුණි.

(ක) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අයවැයෙන් වැඩ ලක්ෂයක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.6,199,450 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, ප්‍රතිලාභීන් 87 ක් සඳහා රු.3,568,993 ක් වැයකර තිබුණි. නියැදි භෞතික පරීක්ෂාව අනුව රු.221,250 ක් වැයකර බිම්මල් ව්‍යාපාරය සඳහා බිම්මල් වගා මළු පුරවන යන්ත්‍රයක් ලබාගත් ප්‍රතිලාභියෙකුගේ එම යන්ත්‍රය නිශ්ක්‍රීයව තිබෙනු නිරීක්ෂණය විය.

(ඛ) ග්‍රාම ශක්ති පලමු සහ දෙවන අදියර යටතේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම 12 ට අයත් සමිති 12 ක් සඳහා මුදල් ලබාදී තිබූ අතර, 2021 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.9,901,991ක් ශේෂ පැවතුණි. විගණිත අවස්ථාව වනවිට සියලුම ග්‍රාම ශක්ති සමිති අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ග) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැඟිල්ල සම්බන්ධව මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශයෙන් ලබාදුන් වාර්තාව අනුව ගොඩනැඟිල්ලේ සැලසුම්වල දෝෂ දක්වා ඇති බැවින්, එම කටයුතු කරනු ලැබූ ආයතනය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඝ) ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ දී ආසන්නයේ පිහිටා ඇති අධි බලැති විදුලි රැහැන් පවතී නම් තිරස් හා සිරස් දුරස්ථභාවය (Horizontal & Vertical Distance) හා එමඟින් ශාරීරික ව ඇතිවිය හැකි චුම්භක (Magnetic Impact) බලපෑම් සැලකිල්ලට ගෙන කටයුතු කළයුතු වුවද, ඒ පිළිබඳව සැළකිල්ලක් නොදක්වා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකරමින් පවතින බව නිරීක්ෂණය විය. බිත්තියේ සිට අඩි 2.5 ක් ආසන්නයේ ඇති මෙම විදුලි රැහැන් ඉවත් කර දෙන ලෙස ගොඩනැඟිල්ලේ 03 වන අදියර ඉදිකරන අවස්ථාවේ දී විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා ඇති අතර, ඒ සඳහා රු.4,023,389 ක් ගෙවිය යුතු බව දන්වා තිබුණි.

3.5 පාඩු හා හානි

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බොරළු කියුබ් එකක ස්ථානීය මිල (පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල කමිටුවේ ස්ථානීය මිල භාවිතා කර තිබුණ ද, පුත්තලම දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/මි.ක/(1)/2021 හා 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බොරළු කියුබ් එකක් පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා භාවිතා කරන ලද බොරළු සහ මිටර් 7482.8 ක් හෙවත් කියුබ් 2641.3 ක් භාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) i. ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැඟිල්ලේ 14 වන බිල්පත ගෙවීම ප්‍රතික්ශේෂ කර තිබූ අතර, බෙරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුවී තිබුණි.

ii. ඉහත කාරණයට අදාලව ඉදිකිරීම්වල දෝෂ නිවැරදි කිරීමට රු.33,770,564 ක ඉංජිනේරු ඇස්තමේන්තුවකින් සහතික කර තිබුණ ද, බෙරුම් කරන ක්‍රියාවලියේ දී එය නොසලකා හැර කටයුතු කිරීමෙන් රජයට රු.18,235,507 ක අලාභයක් සිදුවී තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි අනුමත තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	77	71	06	--
තෘතීයික මට්ටම	59	32	27	--
ද්විතීයික මට්ටම	1810	1715	239	144
ප්‍රාථමික මට්ටම	178	111	67	--
	2124	1929	338	144

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 22 ක් විය.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 19 කට අදාලව පුරප්පාඩු 316 ක් සහ සංවර්ධන නිලධාරී තනතුරට අදාලව 133 ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ඇ) 2022 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අදාලව පරිපාලන නිලධාරී තනතුරු 09 ක්, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු 10 ක්, ග්‍රාම නිලධාරී තනතුරු 115 ක් සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 35 ක් පුරප්පාඩුව පැවතුණි.

එස්. පී. වීරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එස්.පී.වීරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම		
	75% -100%	**50% - 74%**	**0% - 49%**
මානව සම්පත් සංවර්ධන දේශීය හා විදේශීය පුහුණුව			38.5%
ප්‍රසම්පාදන සැලැස්ම අනුගතවීම	95 %		
වාර්ෂික ඇස්තමේන්තු තුළින් සපයා ගන්නා ප්‍රතිපාදන ප්‍රශස්ත උපයෝජනය	91%		
දිස්ත්‍රික්කයට ලැබෙන සියළුම මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම	95%		
ප්‍රතිපාදන අරපිරිමෙස්මෙන් හා කාර්යක්ෂමව මෙහෙයවීම සම්බන්ධව අභ්‍යන්තර පාලනය	95%		
හරිත ඵලදායිතාව සහ පොලිතින් රහිත පරිසරය	80%		
තාක්ෂණය සහ මෘදුකාංග භාවිතය	95%		
ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මකවීම	90%		
පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	89%		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%74 %	75%-100%
01. සෑම තැනකම සෑම ආකාරයකම දරිද්‍රතාව තුරන් කිරීම	සියළුම ආකාරයේ දරිද්‍ර තාවයන්ගෙන් පෙළෙන සියළුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින් කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය 2025 වනවිට අවම වශයෙන් අඩකින් අඩු කිරී	• දරිද්‍රතාවෙන් පෙළෙන පවුල්වල රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් 17719 ක් රැකියා ගත කිරීම			99%
		• පුහුණු වැඩසටහන් 356 ක් පැවැත්වීම			87%
		• ව්‍යාපාර ආරම්භ කිරීමට ණය 40 දෙනෙකුට ලබා දීම		50%	
		• පවුල් 60434 ක් ආදායම් උත්පාදනයට යොමු කිරීම ගෘහ ඵලදායීත් වැඩසටහන්			97%
		• මත් නිවාරණ දැණුවත් කිරීම් වැඩසටහන් 455 ක් පැවැත්වීම			77%
		• පුද්ගලයින් 297 ට ස්වයං රැකියා ආධාර ලබා දීම හා යොමු කිරීම්			101%
		• ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 512 ක් පැවැත්වීම			86%
		• ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් 120 ක් පැවැත්වීම		68%	
		• විගමනික පවුල්වල සාමාජිකයන්ව මූල්‍ය කළමණාකරණය පිළිබඳ දැනුවත් කිරීම 43 ක් පැවැත්වීම.			96%
02. සාගින්න දුරලීම , ආහාර සුරක්ෂිතතාවය හා ඉහල පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් දරුවන් ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන හා අවධානමට ලක්ව තිබෙන ජනතාවට ආරක්ෂාකාරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම	• ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීමම වැඩසටහන් 208ක් පැවැත්වීම		60%	
		• ලක්ෂ 10 අවම ආයෝජනයක් සහිත ගොවිපල ප්‍රවර්ධනය 01 ක් පැවැත්වීම			100%
		• සුළු පරිමාණ කාබනික පොහොර ව්‍යාපෘති 13 ක් සවිබලගැන්වීම		65%	
		• පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් 58 ක් පැවැත්වීම			116%
03.නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම සහ සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	2030 වන විට බෝනොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේ ක්‍රම මඟින් 1/3 කින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	• මද්‍යසාර හා මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සහ සාරධර්ම අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් 251 ක් පැවැත්වීම		53%	
		• උපදේශන ජංගම සායන 26 ක් පැවැත්වීම	46%		
		• ක්‍රීඩා තරඟ 90 ක් පැවැත්වීම			93%
		• වෛද්‍ය සායන 90 ක් පැවැත්වීම		69%	
		• ග්‍රාමීය ක්‍රීඩාපිටි 24 ක් සංවර්ධනය			120%
		• ක්‍රීඩා උපකරණ ලබාදීම සහ ක්‍රීඩා පුහුණුව 32 ක් සිදු කිරීම			200%
		*සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ශරීර සුවතා මධ්‍යස්ථාන 12 ක්ඉදිකිරීම.		67%	

04.පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ප්‍රවර්ධනය කිරීම .	2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම .	• ද්විතීය අධ්‍යාපනයෙන් පසු තරුණ තරුණියන් 600 ක් ඵලදායී තෘතීය අධ්‍යාපනයට යොමු කිරීම			1000%
		• සිසුන් 3630 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ලබා දීම			572%
		• දැනුවත් කිරීමේ වැඩසටහන් 33 ක් පැවැත්වීම			79%
		• ශිෂ්‍යත්ව ප්‍රතිලාභ 3371 ක් ලබා දීම			96%
05.ස්ත්‍රී, පුරුෂ සමානාත්මකතාවය අත්පත් කර ගැනීම සහ සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයින්	කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සියළුම ස්ථානවල සිදු වන්නා වූ සියළුම ආකාරයකම වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.	• හිංසනයට මුහුණ දෙන්නන් වෙනුවෙන් මනෝ සමාජීය උපදේශන සහාය වැඩසටහන් 225ක් පැවැත්වීම			82%
		• ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් 46 ක් පැවැත්වීම		58%	
		• අවධානමට ලක්ව සිටින දරුවන් සුරක්ෂිත කිරීමට අන්තර්ජාල මෘදු පද්ධතිය 12 ක් ස්ථාපිත කිරීම			100%
06. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම .	2030 වන විට සියළු දෙනාටම සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්තතාව ලබා ගැනීමට හැකියාව සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ අවධානමට ලක් වී සිටින පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම .	• සෞඛ්‍ය ආරක්ෂිත වැසිකිලි නොමැති පවුල් සඳහා වැසිකිලි 1059 ක් ඉදිකිරීම.			87%
		• පාසල් දරුවන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 225 ක් ක්‍රියාත්මක කිරීම.			82%
		• පාසල් ලමුන් අතර පෝස්ටර් හා චිත්‍ර තරඟ 23 ක් පැවැත්වීම			70%
		• රාජ්‍ය නොවන සංවිධානවල අවධානයට යොමු කර පවුල් 477 ට අවශ්‍ය පහසුකම් සැපයීම			139%
07. සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය ,තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම	2030 වන විට සියළු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම .	•විදුලිය නොමැති පවුල් 662 ට විදුලිය ලබාදීමට ක්‍රමවේදයක් සැකසීම			88%
08. සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය , පූර්ණ ඵලදායිව සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම .	ළමා ශ්‍රමය තහනම් කිරීම, කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම , සියළු සේවකයන් සඳහා ආරක්ෂාකාරී සේවා පරිසරයක් තිබීම ප්‍රවර්ධනය කිරීම	• වෘත්තීය මාර්ගෝපදේශ සේවා 5241 ක්ලබා දීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය			251%
		• වයස අවු 18-60 ත් අතර පුද්ගලයන් හඳුනාගෙන රැකියා අවස්ථාව සැලසීම සඳහා පුහුණු කිරීම 995 ක් පැවැත්වීම			205%
		• වැඩිහිටි ව්‍යවසායකයන් 103 ක් තොරතුරු ලබාගැනීම හා හඳුනාගැනීම		64%	

09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම , පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම .9	සංවර්ධන වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය ,පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම	•පුද්ගලයන් 02 ට වෙළඳපලට පිවිසීමට අවශ්‍ය සහය ලබාදීම	13%		
		• පාසල් හැරයන තරුණ තරුණියන් ව්‍යාත්තිමය කුසලතා වර්ධනයට උපායමාර්ගික සැලැස්මක් (Lead to Leed) ක්‍රියාත්මක කිරීම			100%
10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	2030 වන විට වයස ,ලිංගික බව,ආබාධිත බව , ජන වර්ගය,ජාතිය,ආගම හෝ ආරථික හෝ වෙනත් තත්වයක් පිළිබඳව තැකීමකින් තොරව සියළුදෙනාගේ සමාජ ආරථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම	• සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ 13699 ක් ක්‍රියාත්මක කිරීම			100%
		• සවිබල ගැන්විය යුතු පවුල් 3402 ක් පාර්ශවයන් සවිබල ගැන්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම			83%
11. නගර හා ජනාවාස පරිපූර්ණ , ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම .	2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුලත්ව නගරය නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර බලපෑම අඩු කිරීම.	• ඉඩම් පරිහරණ සැලසුම් 5ක් සැකසීම	17%		
12. **තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම .**	2030 වන විට අප ද්‍රව්‍ය උත්පාදනය වීම වැලැක්වීම , අඩු කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම.	• ආයතනික, කොට්ඨාස හා දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාපෘති 1437 ක් සිදු කිරීම			96%
13. **දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම .**	දේශගුණික බලපෑම්වලට ලක්වන පවුල් ප්‍රමාණය වාර්ෂිකව 10% දක්වා අඩුකිරීම	• ගංවතුර නිසා නිරන්තර සිදුවන හානි අවම කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීම	33%		
		• රුක් රෝපණ ව්‍යාපෘති 61065 ක් ක්‍රියාත්මක කිරීම		60%	

14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායි භාවිතය	සාගරයට එකතුවන අපද්‍රව්‍ය (නොදිරන) ප්‍රමාණය 20% දක්වා අඩුකිරීම	• වෙරළ පවිත්‍රතා වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කිරීම			100%
15. භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම .	ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණ කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස් කිරීමට උනන්දු කිරීම	• පරිසර සංවේදී කලාපයේ කෘෂිකාර්මික පිළිවෙන් ඇති කිරීමේ ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක කිරීම (ESA)			100%
		• රුක් රෝපණ වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කිරීම			100%
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායි වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම .	උපත් ලියාපදිංචි කිරීමද ඇතුළුව 2030 වන විට සියළු දෙනාටම නීතිමය අනන්‍යතාවක් ලබාදීම	• ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් පැවැත්වීම			86%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග

1. දරිද්‍රතාවය ඉහල යාමට, සෞඛ්‍ය සම්පන්න නිරෝගි ජීවිත අහිමි වීමට, ගුණාත්මක අධ්‍යාපනයක් අහිමි වීමට ආදි වූ කරුණු රාශියකට හේතුවක් වූ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට විවිධ වූ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වූවද මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන පිරිස දිනෙන් දින වැඩිවීම සිදුව ඇත.

2. සියළුම ජනතාවට ආරක්ෂිත පෝෂ්‍යදායි ප්‍රමාණවත් ආහාර ලැබීම තහවුරු කිරීම සාක්ෂාත් කිරීම ප්‍රබල ගැටළුවක්ව පවතින්නේ වසරේ වැඩි කාලයක් වියළි දේශගුණයක් පවතින පුත්තලම දිස්ත්‍රික්කය තුල ඇතිවන නියඟ තත්වය නිසා ගොවිතැන් විනාශ වීම සහ සතුන් විසින් ගොවිතැනට හානි කිරීම

3. මධ්‍යම පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයට හා අනුරාධපුර දිස්ත්‍රික්කය යන ප්‍රදේශ වලට ඇදහැලෙන අධික වැසි ජලය පුත්තලම දිස්ත්‍රික්කය හරහා මුහුදට ගලා බසියි. පුත්තලමට අධික වැසි ඇති නොවූවද දිස්ත්‍රික්කයේ පවතින භූගෝලීය පිහිටීම නිසා ගංවතුර ආපදාවන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවීම අභියෝගයකි.

4. 2022 වසර තුල මුහුණු දුන් ආර්ථික අර්බුද තත්වය ප්‍රධාන අභියෝග විය.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

ශ්‍රේණිය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	56	49	07
තෘතියික	40	23	17
ද්විතියික	1154	960	194
ප්‍රාථමික	177	123	54

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. ජ්‍යෙස්ඨ සහ තෘතික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් යොදා ඇත. (රාජකාරි ආවරණ ,වැඩ බැලීම, රාජකාරි ඉටුකිරීම) ද්වීතීයික නිලධාරින්ගේ පුරප්පාඩු සඳහා සංවර්ධන නිලධාරින් යොදවා රාජකාරි අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. ප්‍රාථමික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට බහු කාර්‍ය නිලධාරින් යොදවා ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව(දින)	සමස්ථ ආයෝජනය / දේශීය දේශීය	වැඩසටහන් ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
1	කාර්යාලය ක්‍රම සම්බන්ධ පුහුණුව	357	දවස් 01	99,220	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
G2	මහජන සම්බන්ධතාවය සහ පාරිභෝගික සද්කාරය	270	දවස් 01	51,500	දේශීය	
3	ව්‍යාපෘති සැලසුම්කරණය , කළමනාකරණය හා අධීක්ෂණය	210	දවස් 01	70,990	දේශීය	
4	පොදු ප්‍රසම්පාදනය හා වත්කම් කළමනාකරණය	145	දවස් 01	33,100	දේශීය	
5	කාර්යාල කළමණාකරණය සහ පරිපාලනය පිළිබඳ මාර්ගගත පුහුණුව - COMA (Online)	59	දවස් 01	10,000	දේශීය	
6	ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුනු කිරීමේ පිළිබඳ පුහුණු වැඩසටහන	118	දවස් 01	37,270	දේශීය	
7	දනාත්මක චින්තන හා ආකල්ප සංවර්ධනය	60	දවස් 01	10,000	දේශීය	
8	ඉඩම් රාජකාරි පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	208	දවස් 01	28,100	දේශීය	
9	ලිපිගොණු කළමනාකරණය	161	දවස් 01	50,190	දේශීය	
10	කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	1	දවස් 40	105,000	දේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණනකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වැනි පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වසර ගණනාවක ට පෙර සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ ඇත.එම ණය ශේෂය කපා හැරීමට අවශ්‍ය කටයුතු කරමින් තිබේ.	භාණ්ඩාගා ර චක්‍රලේඛ අංක 118 අනුව ණය ශේෂ පියවනු ලැබේ.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක	අනුකූල වේ		

	කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විද්‍යුත් පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම**			
20.1	2018.07.19 දිනැති පළාත් පාලන චක්‍ර ලේඛ අංක 2018/e-Local Government-01 අනුව අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම .	අදාල නොවේ.		
20.2	අන්තර් ජාලය හරහා ගෙවීම් සිදුකිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම .	අදාල නොවේ.		
20.3	පාරිභෝගින්ට හිතකර සේවාව සැපයීමේ සඳහා පෙරටු කාර්යාලය හා (Front Offices) පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හඳුන්වා දී තිබීම.	අදාල නොවේ.		